| කැලණිය අධ්‍යාපන කලාපය |
|---|
| දෙවන වාර පරීක්ෂණය - 2017 |

| 07 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | කාලය පැය 1½ යි. |
|---|---|---|

නම : ..................................................................................................

## I කොටස

- **1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සප්තකයේ ඇති ස්වර අතුරින් විකෘති ස්වර බවට පත්වන ස්වර වන්නේ,
(i) ස - ප (ii) ම - ප (iii) රි ග ප ධ නි (iv) රි ග ම ධ නි

02. සප්තකයේ ඇති අචල ස්වර වන්නේ,
(i) ම - ප (ii) ස - ප (iii) රි ග ධ නි (iv) ම ප ධ

03. ග ප̣ ධ̣ ස රි නි̣ මෙම ස්වර ආරෝහණ ක්‍රමයට පෙළ ගැස්වූ විට මුලින් සහ අගින් පිහිටන ස්වර දෙක වනුයේ,
(i) ග නි̣ (ii) ප̣ ග (iii) ස ප̣ (iv) ග ස

04. කෝමළ ස්වර + තීව්‍ර ස්වර = [ ] මෙම හිස්තැනට ගැලපෙන වචනය
(i) ශුද්ධ ස්වර (ii) විකෘති ස්වර (iii) අචල ස්වර (iv) චල ස්වර

05. රි̱ , ග̱ , ධ̱ යන පෙරදිග ස්වර අපරදිග සංගීතයේ එන Sharp ක්‍රමයට සංකේතවත් කරනු ලැබූ විට,
(i) C#, D#, G# (ii) D#, E#, A# (iii) C#, G#, B# (iv) D#, F#, G#

06. අපරදිග සංගීතයේ එන Flate යන්න පෙරදිග සංගීතයේදී හඳුන් වන්නේ,
(i) ශුද්ධ (ii) තීව්‍ර (iii) මන්ද්‍ර (iv) කෝමළ

07. ග රි ස, ම ග රි යන ස්වර අභ්‍යාසයේ මීළඟ ස්වර පිළිවෙල,
(i) රි ග ම (ii) ධ ප ම (iii) ස රි ග (iv) ප ම ග

08. / ස - රි ග / රි - ග රි / ග - ම ග / ප - ප - / මෙම ශුද්ධ ස්වර ස්ථාපන ගී පාදයට අදාළ වචන ප්‍රස්ථාරය,
(i) / ක ඳු ක ඳු / නැ ගෙ නා S / වෙ ර ළෙ හි / හැ පෙ නා S /
(ii) / අෑ S ත අෑ / දි S ය ලි / මෑ S ත ට / පා S වේ S /
(iii) / ක ඳු පෙ ළ / අ ත රේ S / තු රු ව දු / ලේ S S S /
(iv) / බැ ති නා S / සි රි පා S / ක රු ණා S / ක ර නා S /

09. දෘතලය යනුවෙන් අදහස් කරන්නේ තාලයේ,
(i) දෙගුණයයි (ii) වැඩි වේගයයි. (iii) අඩු වේගයයි. (iv) මධ්‍යස්ථ වේගයයි.

10. ස්ථිර ලයක් පවත්වා ගනිමින් ගායනයට සහාය කරගත හැකි සුදුසුතම ස්වර වාද්‍ය භාණ්ඩයකි,
(i) විදුලි ඕගනය (ii) ගිටාරය (iii) සර්පිනාව (iv) වයලීනය

11. 'සුවඳ පත්ම ඕළු ආදී' මෙම ගී පාදයේ මාත්‍රා නිවැරදිව බෙදී ඇත්තේ,

(i) සු ව ඳ / ප ත් ම ඕ / S ළු ආ / S දී S S /

(ii) සු ව ඳ ප / ත් ම ඕ S / ළු ආ S දී / S S S S /

(iii) සු ව ඳ / ප ත් ම / ඕ S ළු / ආ S දී /

(iv) සු ව / ඳ ප ත් ම / ඕ S / ළු ආ S දී /

12. මැදුම් තනි තිතට අනුව පද ප්‍රස්ථාර කළ හැකි ගී පාදයකි,

(i) සුවඳ හමන මලක් විලස (ii) කඳුපෙළ අතරේ තුරු වදුලේ

(iii) මිහිකත නලවාලා (iv) කඳුකඳු නැගෙන වෙරළෙහි හැපෙනා

13. සුළු තනි තිත හා මහ තනි තිත යන තිත් රූපවලට අදාළ හින්දුස්ථානි තාල වන්නේ පිළිවෙළින්,

(i) ලාවනී / ත්‍රිතාල් (ii) දාදරා / ලාවනී

(iii) ත්‍රිතාල් / දාදරා (iv) දාදරා / ත්‍රිතාල්

14. නීතීඥ ජෝන් ද සිල්වා ශූරීන්ගේ ''රාමායනය'' යනු,

(i) චිත්‍රපටයකි. (ii) ටෙලි නාට්‍යයකි. (iii) නාඩගමකි. (iv) නූර්තියකි.

15. ඉහත සඳහන් රාමායනයෙහි එන ගීතයකි,

(i) කරුණාව සමඟ හොඳ හිත පතුරන්න හැම කෙරේ. (ii) අඹ දඹ නාරං කෙසෙල් දෙල්

(iii) දන්න වංහුං අප කන්න සාමි රාජ ධූරයේ (iv) මව්පියෝ ආදී සොඳුරු තමාගේ

16. ස්වර පුවරුවක් රහිත ස්වර වාද්‍ය භාණ්ඩයකි,

(i) හාර්මොනිකා (ii) විදුලි ඕගන් (iii) හාමෝනියම් (iv) මෙලෝඩිකා

17. උපදේශාත්මක ගීතයක් නොවන්නේ,

(i) ලෝකෙන් උතුම් රට ලංකාවයි. (ii) දැඩිකළ මාතා පෙම්බර මාතා

(iii) හිතන්නකෝ අයියේ (iv) පාන් කිරිත්තා තක්කිට තරිකිට

18. ගීතයක නාද මාලාව එය ගයන ගායකයා හෝ ගායිකාව ගයන ආකාරයටම වාදනය කිරීම,

(i) ගීය ප්‍රති නිර්මාණය කිරීමයි. (ii) ගී රසවින්දනයයි.

(iii) ගී අනුවාදනයයි. (iv) ගීය ප්‍රතිවාදනය කිරීමයි.

19. සබේ විදානේ, මුදලි තුමා, ආරච්චි රාළ වැනි චරිත දක්නට ලැබුණු පහත රට ජන නාට්‍ය විශේෂය,

(i) කෝළම් (ii) නූර්ති (iii) සොකරි (iv) නාඩගම්

20. ඉහත පිළිතුරට අදාළ නාට්‍යයන්හි දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් නොවන්නේ,

(i) ගැහැණු චරිත පිරිමින් විසින්ම රඟපෑම (ii) වෙස්මුහුණු භාවිතය

(iii) උඩරට නැටුම් වලින් සමන්විත වීම.


(iv) ගීත ගායනයේදී සහායට සර්පිනාව, පහතට බෙරය, තාලම්පට වැනි භාණ්ඩ යොදා ගැනීම.

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 2 ක් තෝරාගෙන ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

01.




(i) ඉහත දැක්වෙන ස්වර පුවරුවෙහි අංකනය කර ඇති ස්වර නිවැරදිව සංකේතවත් කර එම අංක යටතේ ලියා දක්වන්න. (ලකුණු 08)

(ii) ඉහත ලියා දක්වන ස්වරවලින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| මන්ද්‍ර සප්තකයේ ස්වර | මධ්‍ය සප්තකයේ ස්වර | උච්ච සප්තකයේ ස්වර |
|---|---|---|
| | | |

(ලකුණු 04)

02. (i) පහත දී ඇති ස්වර අභ්‍යාස තුනෙන් එකක් තෝරාගෙන එහි ආරෝහණය පමණක් ලියන්න. (උච්ච ස දක්වා ලිවීම ප්‍රමාණවත්)

* ග රි ස රි ග * සග , රිග, සරිස * සස, ගරි, සරිස

නැතිනම්

ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක (උච්ච ස දක්වා ස්වර විහිදෙන) ගීත ස්වර ප්‍රස්ථාරය ලියා දක්වන්න. (ලකුණු 10)

03.

| A | B |
|---|---|
| * හින්දු ස්ථානී රාගධාරී සංගීතයට අනුව නිර්මාණය වූ කර්ණ රසායන වූ ගීත ඇතුළත්ය.<br>* තාල වාදනය සඳහා තබ්ලාව යොදාගනු ලැබීය.<br>* නීතිඥ ජෝන් ද සිල්වා ශූරීන් මෙම නාට්‍ය බොහොමයක් නිශ්පාදනය කර ඇත. | * වෙස් මුහුණු පැළඳ ගනිමින් ගැහැණු චරිත පිරිමින් විසින්ම රඟ දක්වනු ලබයි.<br>* තාල වාදනය සඳහා දෙවොල් බෙරය භාවිතයට ගනු ලැබීය.<br>* හාස්‍ය රසය ජනිත කරවනු ලබන නාට්‍ය විශේෂයකි. |

(i) ඉහත වගුවේ A හා B කොටස් යටතේ ඇති තොරතුරු වලින් ඉස්මතු වන නාට්‍ය විශේෂයන් දෙක වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) එම එක් නාට්‍ය විශේෂයකට අයත් ගීතයක් ලියා දක්වන්න. (ලකුණු 08)

04.

| | |
|---|---|
| 1 | / පි න ව න / දු වු ද න / සෑ S S S / ම S S S / |
| 2 | / + ර ළ ලා S / උ පු ලා S / + ලෙළු ම තු / ලා S යා S / |
| 3 | හෙළ / ජා S ති ක / අ භි මා S / නේ S S S / |

(i) ඉහත 1, 2, 3 යන ගී පාදවලින් සමග්‍රහය / අවග්‍රහය / විෂමග්‍රහය යන ග්‍රහයන්ට ගැයෙන ගී පාද හඳුනාගෙන එම ගී පාදය ඉදිරියෙන් ඊට අදාළ ග්‍රහය කුමක්දැයි ලියන්න. (ලකුණු 03)

(ii) දරු නැලවිලි ගී හා රබන් ගීවල දක්නට ලැබෙන විශේෂතා 03 බැගින් වෙන වෙනම ලියන්න. (ලකුණු 03)

(iii) එම එක් ගී වර්ගයක් සඳහා නිදසුනක් ලියා දක්වන්න. (ලකුණු 04)